Copyrighted Material

*Elephant Adventure*

**WILLARD PRICE**

# ඇලි ඇත් දඩයම

MusesBooks®

අනුවාදය

**විජයරත්න දොළවත්ත**

MusesBooks

www.musesbooks.com

Copyrighted Material

# 01

# අලි සමඟ වාද විවාද එපා

සද්දන්ත අලියෙක් මඟ අවහිර කරගෙන සිටියේය. අයියා මලෝ දෙදෙනා අධික බැවුමක් සහිත මඟේ ඉහළ නඟිමින් සිටියදී, එක්වරම අඳුරක් පැතිරුණේ හිරු වලාකුළකට මුවාවීම නිසාවෙනැ'යි සිතූහ. එහෙත් හිරු මුවාවී ඇත්තේ වලාකුළකට නොවන බව ඔවුන්ට දැන, දැකගත හැකි වූයේ හිස ඔසවා බැලූ විටය.

දෙසොයුරන් නඟිමින් සිටි හෙල ඉස්මත්තේ පාර අවුරා නැඟීසිටි දැවැන්ත අලියෙකි. සද්දන්ත හස්ති රාජයෙකි. ඔවුන් මින් පෙර කවම කවරදාකවත් දැක නොතිබූ අන්දමේ සුවිසල් ඇතෙකි ඒ. ඇතා දැකීමෙන් දෙසොයුරන් මෙන්ම, දෙසොයුරන් දැකීමෙන් ඇතාද මවිතයට පත්වූ ලෙසකි. ඇතා හිටිවනම පාර මැද නැවතී, වේගයෙන් ඇසිපිය හෙළමින්, ඔවුන් දෙදෙනා දෙස බලා සිටියේය. ඌ තරහින් ගොරවමින් ඉදිරි මඟ දිසාවට හොඬවැල දිගු කරමින් ඉව ඇල්ලුවේය. විසල් කුළු දෙකක් බඳු උගේ දෙකන් පෙති හකුළුවාගෙන, ගෙල දෙපසට තද කරගෙන තිබිණි. විටින්විට ඌ ඒවා හකුළුවමින්, දිගහරිමින් සිටියේ විශාල උද්‍යාන කුඩ යුගලයක්, නවන්නාක් දිග අරින්නාක් මෙනි.

හිස දෙපසින් වූ උගේ දෙකන් පෙති කොතරම් විශාල වීද යත්, ඒවා කෑම මේසයක මතුපිටට ගතහොත්, අට දෙනෙකුගේ කෑම මේසයකට වුව

Copyrighted Material



මනාව සැහේ. දෙකන් පෙති දෙපසට විහිදා ලූ විට අඩි දහහතරක් පමණ විය හැකිය.

හල් හන්ට් දවැන්තයාගේ රාජකීය තේජස්වී විලාසයෙන් වශීකෘතව බලා සිටියත්, ඔහුගේ සොහොයුරු රොජර් හන්ට්ට නම් මේ උගේ ගරු ගාම්භීර උදාරම් ලීලාව අගය කරමින් බලා සිටීමට වේලාවක් නොවේ.

"ඉක්මන් කරලා මෙතනින් පැනගන්ට බලමු." ඔහු යෝජනා කළේය.

"කොහාටද?" මඟ දෙපස ඝන බිත්ති මෙන් වැවී ඇති වන ළැහැබ්ය. ඉදිරියෙන් මඟ අවුරා සිටින හස්ති රාජයාය.

"ආපස්සට දුවමු." යළිත් රොජර් කීවේය.

"ඒක හරියන වැඩක් නෙවෙයි. උෟ අපේ පස්සෙන් පන්නාවි. අපිට වැඩි වේගයකින් උෟට දුවන්ට පුළුවනි. එහෙම කළොත් වෙන්නේ අපි දෙන්නා ටොන් හය හතකට යටවෙලා චප්පවෙන එක විතරයි." හල් කීවේය.

"ඔහොම අනංමනං හිත හිතා ඉඳලා හරියන්නේ නෑ. අපි කොහොමහරි පණ බේරාගන්න බලමු."

මෙතෙක් කුමක් කළ යුතුද'යි තීරණයක් ගත නොහුණු විටෙක මෙන් දෙගිඩියාවෙන් පසුවූ සද්දන්තයා එකවරම හොඬය ඔසවා, කට බලියා, පරිසරය දෙවනත් කරමින් කුංචනාද කළේය. බඹ දෙක තුනක තරම් එහා මෙහාවෙන් නැගි ඒ මරහඬින් අයියා මලෝවරුන්ගේ කන්අඩි පුපුරා යන තරම් විය. සියලඟ හිරිවැටී ගියේය. අවට පරිසරයේ තුරු මත ලැග සිටි වඳුරන්, රිළවුන්, සියොතුන් මර බියේ විවිධ හඬ නගමින් නොසන්සුන් වී ගියේය.

හල් පිටුපස හැරී බැලුවේය. ඔවුන් සමඟ දඩයම් සවාරියට සහභාගි වීමට පැමිණ සිටි කළු ජාතික පිරිස්, අඩි පනහක පමණ දුරකින් එකට ගුළි වී බියෙනැලළී සිටියහ. උන්ගෙන් එකෙක් පමණක් නිර්භයව හල් පිටුපසින්ම රැඳී සිටියේය. ඒ ජොරෝ නම් වූ ඔහුගේ ප්‍රධාන මං පෙන්වන්නාය. ඔහු අතේ වූයේ අලි වෙඩි තබන තුවක්කුවය. ඔහු එය හල්ගේ අතට දෙන්ට සූදානම් විය. හල් හිස වනා එය ප්‍රතික්ෂේප කළේය.

"අපි මූ පණපිටින් අල්ලාගන්න බලමු." හල් කීවේය.

හල් උෟ අල්ලාගැනීමට කළ යෝජනාවට ජොරෝ ප්‍රතිචාර දැක්වූයේ දත් විළිස්සාලීමෙන් පමණි. ඔහු නිර්භීතයෙකි. ඔහු සමඟ සිටින අනිත් උන්ද එකවාගේ නිර්භීත උන්ය. මේ සතා පණපිටින් අල්ලාගන්ට සිතන්ට පළමු, තම තමන් පණපිටින් සිටිය යුතු නොවේද'යි ඔහු කල්පනා කළේය. කළු ජාතික සහායක පිරිස ඉදිරියට හෝ පසුපසට හෝ යාමට බියෙන් ගල්ගැසී ගත්වනම සිටියහ. 'සඳ අරණට' ආවේණික අරුම පුදුම ඝනසැරේට වැවී තිබුණ වන බූටෑවන්, ගමන්මඟ දෙපස බැඳි තාප්පයක් බඳුය. කෙසේවත් දිවගොස් නම් මුගෙන් බේරීගැනීමට නුපුළුවන් බව හල් දන්නේය.

Copyrighted Material



පසුපසට ගොස් නම්, බේරීමට තරම් කාලයක් වේලාවක් ඇත්තේවත්, සද්දන්තයාගෙන් ඒ සඳහා කාලයක් වේලාවක් ලැබෙන්නේවත් නැති බව හල්ට සිකුරුය. පොළොව පළාගෙන යන්නට හැකි නම්? එහෙත් එය කළ හැකි දෙයක් නොවේ.

දැනට ගැලවීමට ඇති එකම මඟ, ඉහළට යෑමය. ඉහළට යෑම කළ හැකි දෙයක්ද? "රොජර්, බේරෙන්ට තියෙන එකම මඟ ඉහළට යෑම. ඉක්මන් කරපන්. ඉක්මන් කරපන්. මගේ කරට නැඟිලා ඔය ගහෙන් පහතට එල්ලා හැලෙන මාලුවා වැලේ එල්ලියන්." හල් කියද්දී රොජර් වහා ක්‍රියාත්මක විය. ඔහු හල්ගේ කරපිට නැඟී, ගහෙන් එල්ලා හැලෙන වැලක් අල්ලාගෙන ඉහළට නැඟිණ. නිරක්ෂය ආශ්‍රිත වනාන්තරයෙහි අනන්තවත්, ඉහළ ගස් මුඳුන්හි එතී, ගැලතී, වෙළී, පහතට එල්ලී හැලෙන වැල් එමට තිබේ. මේවා බෙහෙවින් ශක්තිමත්ය. නැව් කඹවලට නොදෙවැනි තරම් සවිමත්ය.

රොජර් වඳුරෙකු මෙන් ඉහළට, ඉහළටම වැලේ එල්ලීගෙන නැඟගත්තේය. සද්දන්තයා රොජර්ගේ මේ අරුම පුදුම සරඹ ක්‍රීඩාව දැක්මෙන් මවිතයට පත් වූ ලෙසින්, ඔහු දෙස බලාගෙන සිටියේය.

"ජොරෝ, බලා ඉන්න එපා. ඉක්මන් කරපන්. උඹත් ඒ විදියට උඩ නැඟියන්." හල් තම හිතවත් මඟ පෙන්වන්නාට කීවේය.

"නෑ මාස්ටර්, මාස්ටර් ඉස්සෙල්ලා නගින්න. මං ඊට පස්සේ." ඔහු කීවේය.

"ජොරෝ, මෙතන වාද කර කර ඉන්න වෙලාවක් නෑ. ඉක්මන් කරපන්. මං කියන විදියට කරපන්." හල් තරමක් සැරෙන් කියද්දී ජොරෝට එකඟ නොවී සිටිය නොහැකි විය. ඔහු වහා තුවක්කුව කරේ එල්ලාගෙන, හල්ගේ උරහිසට නැඟී, රොජර් මෙන් ඉහළට නැඟගත්තේය. ජොරෝ උඩ නගිනුදු ඇතා ඇසිපිය නොහෙළා බලා සිටියේය.

තවත් බලා සිටියොත් අනෙකාත් ඉහළ නැඟෙතැ'යි සිතූ විටෙක මෙන්, සද්දන්තයා අඩියක් ඉදිරියට තිබ්බේය. ඒ සමඟම ඌ යළිත් හොඬය ඉහළට ඔසවා කුංචනාදයක් කළේ පරිසරය දෙවනත් කර හරිමිනි.

"මාස්ටර්, මාස්ටර්... ඉක්මන් කරන්න. ඉක්මන් කරන්න."

ජොරෝ වැලක තොණ්ඩුවක පයක් පටලවාගෙන, හිස පහතට දමා හල්ට අතක් දිගු කරමින් කෑගැවේය. හල් උඩ පැන ඔහුගේ අතේ එල්ලී ඉහළ නැඟුණේය.

සද්දන්තයා මුලින් කළාක් මෙන් සරඹ සංදර්ශනය නරඹමින් සිටින්නට කල්පනා නොකළේය. ඌද වහා ක්‍රියාත්මක වූයේය. හල්ට ඔහුගේ කලිසම් කකුල දිගේ ඉහළට උණුසුම් වාෂ්පයක් නැඟෙන්නා සේ දැනුණේය. ඔහුගේ එක් පාදයක්, කිසියම් මෘදු, එහෙත් සවිමත් ග්‍රහණයකට හසුවී ඇති ලෙසක් වැටහී ගියේය. ඇත් රජා හල්ගේ පාදයක් එතුමාගේ හොඬය කෙළවරින් අල්ලාගත්තේය.

MusesBooks®

Copyrighted Material



දැන් ජොරෝ ඉහළට අදියි. ඇත් රජා පහළට අදියි. ඇතාගේ හොඬය හල්ගේ පාදයේ දවටී තිබෙන්නේ යාන්තමින් වුවත්, ජොරෝගේ ඉහළට ඇදීමට වඩා ඇතාගේ පහළට ඇදීම වේගවත්ය. දැන් දැන් තමා දෙකට ඉරී, ජොරෝ අතේ කඳ කෑල්ලත්, ඇතාට ඉගටියෙන් පහළත් හිමිවනු ඇතැ'යි හල්ට හැඟෙයි. මෙතරම් වේදනාකාරී අසීරු අඩියකට, අකල් මරණයකට ගොදුරු වීමට ආසන්න අවස්ථාවකට පත්ව සිටියදීත්, හල්ට තමාගේ සිරුර රබර් පටියක්, එසේත් නැත්නම් ඉලාස්ටික් පටියක් මෙන් ඇදෙන අයුරු දැනෙද්දී, හැඟෙද්දී, මුව'ගට නැඟුණේ මද සිනාවකි. මෙතුවක් මරබියෙන් ගැහෙමින් කරකියා ගතහැකි දෙයක් නොහී, මේ මාරාත්මක ක්‍රීඩාව දෙස බලා සිටි රොජර්ගේ මුහුණේද සිහින් සිනා ඉරක් ඇඳී ගියේය.

'දැන් නම් මගේ උස අඩි හතක් විතර වෙලා ඇති.' හල්ට සිතුණේය. එහෙත් අඩි හතක් නොව අටක් උස ගියත්, ඒ උස ඇතිව ජීවත්වන්නට නම් වාසනාවක් ලැබෙතැ'යි ඔහුට ඒ සමඟම නොසිතෙයි. ජොරෝගේ දෑතේ වීරිය ඉක්මවා ඇතාගේ හොඬයේ ශක්තිය වැඩි වුවහොත්, අඩි හත අට උස කෙසේ වෙතත්, තමාගේ සාමාන්‍ය උස වූ අඩි හය එක්කවත් ජීවත්වන්නට අවස්ථාවක් නොලැබෙන බව ඔහුට වැටහෙයි.

ඇත් හොඬයට දිනුම ලැබුණොත් තම සිරුර සිහින්, තියුණු තුඩු ඇති දළ දෙකින් ඇස් වට්ටියක් මෙන් සිදුරු වී යනු සිකුරුය. එසේත් නැත්නම් ටොන් හය හතක බරකින් තෙරපී චප්ප වී යනු නොඅනුමානය.

එවිටම ජොරෝගේ පිරිස එතැනට කිට්ටු කළේ යටිගිරියෙන් හූ කියමින්, මරහඬ නඟමින්, බෙලෙක්කවලට තට්ටු කරමින්, එකැස් බෙර හඬතළමින්, සද්දන්තයාගේ අවධානය වෙනතකට යොමු කරවා ගැනීමටය.

එහෙත් ඒ හැම කලබැගෑනියකටම ඇතාගේ ප්‍රතිචාරය වූයේ හල්ගේ පාදයේ ග්‍රහණය අත නැරම මාරක කුංචනාදයක් නැංවීම පමණි.

ඇත්ත වශයෙන්ම ඒ අවස්ථාවේ ඇතාගෙන් නැඟුණේ සුපුරුදු කුංචනාදයක්ම යැයි කිව නොහේ. මෙවන් සද්දන්තයකුගෙන් පිටවෙතැ'යි කිසිසේත්ම සිතිය නොහෙන අන්දමේ හඬකි. මෙවන් මොහොතකදී උගෙන් ඕනෑම කෙනෙක් බලාපොරොත්තු වන්නේ අධික කෝපයෙන් නැඟෙන ගෙරවිල්ලකි. එහෙත්, මේ හඬ නම් වේගයකින් හා මහා හඬකින් නැඟුණත් ගෙරවිල්ලකට නොව, වඩාත් හුරු වූයේ වේදනාවකින් නැඟෙන කෙඳිරිල්ලකටය. සද්දන්තයාගේ සිරුරේ ප්‍රමාණය අනුව නම් උෟ වෙතින් නැඟිය යුතු වන්නේ කේශර සිංහයන් දහ දොළොස් දෙනෙක් එක විට ගර්ජනා කරන විටෙකදී මෙන් බිහිසුණු හඬකි. දැන් ඇසුණ මේ හඬ නම්, කොවින් වියරුවන් ගැහැනියකගේ හඬක් වැන්න. ඒ හඬේ කෝපයද මුසුවී තිබේ. අසා සිටින්නන්ගේ සිරුරේ රෝම කූප නඟා සිටවනසුලු විය. භීතියෙන් මුසපත් වනසුලු විය.

Copyrighted Material



මේ අතර පිරිස් නඟන අඬහැරය උෟට රිස්සුම් නොදෙන ලෙසක් පෙනී ගියත්, උෟ මිනිසුන් මෙන් වැඩ අනා ගන්නට අකැමති ලෙසකි. 'එක් වරකට එක වැඩක් පමණයි.' ප්‍රතිපත්තියේ උෟ දැඩිව පිහිටා සිටින ලෙසකි. 'මං උඹලා කොයි කවුරුත් ගැන පස්සේ බලාගන්නම්. දන් මේ වැඩේ අහවරයක් කරලා ඉන්න ඕනෑ ඔක්කෝටම ඉස්සෙල්ලා' කියන්නාක් ලෙසින්, උෟ හල් අතහැරීමට කල්පනාවක් නැත. දවැන්තයා හල්ගේ පය අතහැරියේම නැත. උෟ පහළට අදියි. ජොරෝ ඉහළට අදියි.

මේ අතර ඉහළින් කිසියම් බුරුලක් ඇතිවන්නාක් මෙන් හල්ට දැනිණ. ජොරෝගේ පය පටලවාගෙන සිටි, වැලේ තොණ්ඩුව බුරුල් වීගෙන යයි. යම් හෙයකින් වැලේ තොණ්ඩුවෙන් ජොරෝගේ පය ගිලිහී ගියහොත් මුහුණපාන්නට වන හෙයියම්මාරුව සුළුපටු එකක් නොවේ. හල්, ජොරෝ දෙදෙනාම බැරිවෙලාවත් බිම වැටුණොත්? ඔවුන්ගේ දඩයම් සවාරිය කෙළවර වන්නේ හස්ති රාජයාගේ පාදය යටිනි.

"ජොරෝ මාව අතෑරපන්. මේ විදියට ගියොත් මං විතරක් නෙවෙයි, උඹත් අමාරුවේ. අතෑරපන්. මගේ අත් අතෑරපන්!" හල් කෑගැසුවේය.

මෙතුවක් හල්ගේ මොන නියෝගය පිළිපැද්දත්, සුවච කීකරු දාසයෙකු මෙන් ඕනෑම අණකට අවනත වුවත්, ඔහු මේ නියෝගය නම් නොපිළිපැද්දේය. ඔහු ඒ වෙනුවට කළේ හල්ගේ දෑත් තව තවත් දැඩිව ග්‍රහණයට ගැනීමයි.

මේ අතර තවත් යමක් ලිස්සා, ගිලිහී යාමට සූදානම් වන ලෙසකි. ඇත් හොඬ ඩැහැගෙන තිබෙන හල්ගේ පාදයේ බූට් සපත්තුව මැහුම් දෙදරා පිපිරී බුරුල් වනු ඔහුට දැනෙයි. එක්කෝ එය හල්ට බැරිවීමකින් හරියට ගැටගසා නොතිබුණා විය හැකිය. එසේ නැත්නම්, නිෂ්පාදකයාගේ මැස්මේ කිසියම් අඩුපාඩුවක් තිබී ඇතිවාක්ද විය හැකිය. ඒ කොයි එක කොහොම වුණත් මේ අවස්ථාවේ ඒ සුළු වරද ඔහුගේ වාසනාවට හේතුවක් වීමට කරුණු යෙදී තිබේ. එහෙත් අනෙක්අතින් ඔහුට තම බූට්ස් කුට්ටමෙන් එකක් අහිමි වන ලකුණුද පෙනේ.

ඇත්ත වශයෙන්ම මේ හල් ළඟ තිබූ, ඉස්තරම්ම වර්ගයේ බූට්ස් කුට්ටමකි. උදා වී ඇති අනතුරුදායක තත්ත්වය අනුව බූට්ස් කුට්ටමෙන් එකක් අහිමිවීමෙන්, අහිමිවීමේ තර්ජනයකට මුහුණ පා ඇති ඊට වඩා වැඩි අගයකින් යුතු දෙයක් ඉතිරිවීමට ඉඩ තිබේ. ඔහු කකුල අඹරවා, කරකවා බූට්ස් සපත්තුව ගිලිහී යෑම පහසු කිරීමට උත්සාහයක් දැරුවේය. ඇත් රජාගේ ඇදීම නිසා එය වඩාත් පහසු වූයේය.

හල් වහා කකුල ඉහළට ඇදගත්තේය. ජොරෝ ඔහු වැලක එල්ලී ගන්නා මානයට ඇදගත්තේය. ඉන්පසු දෙදෙනාම ඇත් රජාගේ 'කළු සර්පයාගේ' ළංවීමේ මානයෙන් ඔබ්බට නැඟගත්තේය.

Copyrighted Material



ඇතා ඉවක් බවක් නැතිව බූට් සපත්තුවට පහර දෙන්නට විය. ඌ සමහරවිට හිතාගෙන ඇත්තේ සතුරාගේ කැල්ලක් කඩාගත්තා කියා විය හැකිය. ඌ එය කිහිප වරක්ම පොළොවේ ගැසුවේය; පාගා දැමුවේය; බිම දමා දළෙන් ඇන්නේය; කටේ දමා ඒ හක්කට මේ හක්කට කරමින් හපා දැම්මේය; අන්තිමේදී බූට් සපත්තුව දිගටම දහ අවුරුද්දක් පාවිච්චි කළාටත් වැඩියෙන්, හප කර දැම්මේ තත්පර දහයක් වැනි සුළු කාලයක් ඇතුළතය. මැහුම් කැඩී, ගැලවී, අඩිය ගැලවී, විසිවී, ඒ මේ අතට නැවී, හැකිළී, එය වරෙක බූට් සපත්තුවක්ව තිබුණු බවක්ද දැනගන්නට නොහැකි අන්දමින් විනාශ කර දැම්මේය.

ඉන්පසු ඇතා එය පොළොවේ වළක් හාරා වළලා දැම්මේය. අලි ඇතුන්ගේ මෙවන් චර්යාවන් ගැන ඔවුන් මින් පෙර අසා තිබුණත්, උන් ඒවා ක්‍රියාවට නංවනු දුටු පළමු වතාව මේ විය. අලියා තම සතුරා මරාදැමූ පසු දේහය වළ දැමීම හෝ කොළ රොඩු අතු රිකිලි ආදියෙන් වසා දමා ගෞරවනීය භූමදානයක් කිරීම උන්ගේ සිරිතය. උන් ඒ අන්දමින් කරන්නේ ඇයිද’යි කීමට කිසිවෙකුත් නොදනියි. ඒ උගේ සිතිවිලි දැන කියාගන්නට ක්‍රමයක් නොමැති හෙයිනි.

අලියා සම්මිශ්‍ර චිත්තාවේගයන් ඇතිවන සත්ත්ව විශේෂයකි. ඌ විටෙක දරුණුතම කේන්තිකාරයෙකු වන අතර, තවත් විටෙක මෘදුතම කාරුණිකයෙකුද වේ. ඌ විටෙක ත්‍යාගවන්තයෙකි; විටෙක ඊර්ෂ්‍යාකාරයෙකි; විටෙක කෙළිලොල්ය; විටෙක දරුණුය; ලැජ්ජාශීලී ගතිය මෙන්ම නිර්භයකමද ඌට ඇත. බිහිසුණු වන්නා සේම, මුදු මොළොක් බවද ඌට තිබේ. ඔබ ඌ ළඟින් මාරුවන විට, ගණන් ගන්නේවත් නැත. එහෙත් ඔබ උගේ ගමන්මග අවහිර කළොත්, එය ඌ ඉවසන්නේ නැත.

‘අලියාට ඌ යන ගමන්මගේ අවහිරයක්, බාධාවක් නැතිව යාමට අයිතිය තිබේ.’

අප්‍රිකාවේ මංමාවත්හි මෙවන් අනතුරු හඟවන පුවරු බහුලව දක්නට ලැබෙන්නේ ඒ නිසාවෙනි. වෙනත් සතුන් නම් පාරෙන් අයින් වී හෝ ඉවතකට පැන ඉඩ දුන්නත් අලියාගෙන් නම් එවන් හැසිරීමක් බලාපොරොත්තු විය නොහේ. ඌ කිසිවෙකු හෝ කිසිවක් මායිම් කරන්නේ නැත.

අලියා සමහරවිට උගේ ශක්තිය හෝ තරාතිරම ගැන දැන සිටිනවා විය හැකිය. ඉතින් තමා වැනි බලවතෙක් වෙනත් කාටවත් කුමට මායිම් කරන්නේද’යි ඌ සිතනවා විය නොහැකිද? මිහිමත වෙසෙන දැවැන්තම බලවතා අලියාය. එමෙන් ඔහුට රාජකීය පෞරුෂත්වයක්ද තිබේ. ඌ මිනිසුන් දකින්නේ ‘කුරු පුංචන්’ ලෙස විය හැකිය. කාරයක හෝ වෙනත් වාහනයක සිටින මිනිසාට වුව උගේ විශේෂ සැලකිල්ලක් නැත. වාහනයක නළාවක් හැඬවීමෙන් ඌ බිය ගැන්විය නොහේ. සමහරවිට ඌ ඉන් කුපිත

www.musesbooks.com

Copyrighted Material



විය හැකිය. එවන් අවස්ථාවන් බොහෝ විට කෙළවර වන්නේ මිනිසා මෙන්ම වාහනයද ප්‍රහාරයකට ලක් වී සුනු විසුනු වීමෙනි.

මිනිසාට තමා අසල හැසිරෙන මැස්සෙකු මදුරුවෙකු යම්සේද, අලියාට ඌ අසලින් යන එන මිනිසාද එවැනිය. මිනිසෙකු හෝ වේවා සතෙකු හෝ වේවා අලියාට තරහ ගොස් මරාදමූ පසු සතාට ගෞරවනීය අවසන් කෘත්‍යයක්, භූමදානයක් සිදු කරන්නේය. හල්ගේ බූට්ස් සපත්තුව ආදාහනය කළ මේ කඳුකර දූවැන්තයා, අපට පරිසරයේ සුලබ පෙඳ හා පාසි තොගයක්ම ගෙනැවුත්, සපත්තුව වළ දැමූ තැනට උඩින් ඇතිරුවේය. ආදාහන කෘත්‍යය අවසන් වූයේ එය මුළුමනින්ම වැසීගිය පසුවය.

"දැන් ඉතින් ඌ යන්ට යයි මගේ හිතේ." රොජර් කීවේය.

"නෑ, මට නම් ඒක සැක සහිතයි. අලියා එහෙම ලේසියෙන් අමතක වෙන ජාතියේ එකෙක් නෙවෙයි."

"ඌට අප අමතක වුණා කියලා හිතන්න එපා. අනිත් එක එයා යනවට අපි කැමතිත් නැතේ? අපි කොහොමහරි එයා අල්ලාගන්ට බලමු." හල් කීවේය.

"අනේ අම්මපා හල්... මට නම් පේන්නේ උඹට ඔල්මාදේ හැදිලා වගෙයි. අපට පුළුවන්ද ඔය සද්දන්තයා අල්ලා මේච්චල් කරගන්ට?" රොජර් ඇසුවේය.

"ඒයි! හොඳට අල්ලාගනිල්ලා, ඔන්න ඔන්න යාළුවා එනවා." හල් කීවේය.

සද්දන්තයාට ඔවුන් අමතක වී තිබී නැත. ඌ උඩ බලා ඔවුන් නැඟී සිටි ගස යටට පැමිණියේය.

"එයා ඔය ආවට අපිව අල්ලාගන්ට මිනිහට බෑ. මොකද අලින්ට ගස් නගින්න පුළුවන් එකක්යැ?" රොජර් කීවේ මුව'ගට සිනාවක්ද නගමිනි.

"හැබැයි එහෙම හිතන්ටත් එපා. එයාට ගස් නගින්ට බැරි බව හැබෑව. ඒත් ගස් පෙරළන්ට පුළුවන්. තරහා ගිය, මදකිපුණු අලි වනාන්තරවල පැත්ත පළාතම පෙරළලා, සමතලා කරලා, විනාශ කරලා තියෙනවා මං දැකලා තියෙනවා." හල් කියද්දී රොජර්ට බියක්ද ඇති නොවුණා නොවේ. උස් ගස්වල අතු ඉති කඩා ගැනීමට හොඬවැල දිග නොවුණු විටදී පවා, ගස බිම පෙරළා කොළ අතු කා දැමීමට අලි පසුබට නොවෙති.

"මේ ගහ මිනිහට විශාල වැඩියි. මේක මහ සද්දන්ත ගහක්නේ." ඇත්ත වශයෙන්ම රොජර්ට ඕනෑ කළේ මෙවන් අදහසක් අනෙක් අයට කියාපානවාටත් වඩා, තමාටම කියා ගනිමින් සිත සතුටු කරගැනීමය.

"මට නම් රොජර් උඹේ අදහස අනුමත කරන්න අමාරුයි. මේ ගහ විශාලෙට වැඩුණත් මේවායේ මුල් ඒ තරම් පොළොව යටට කාවදින ජාතියේ ගස් වර්ගයක් නෙවෙයි. කොයිකටත් තදින් අල්ලාගෙන හිටපල්ලා." හල් කියා කට ගන්නවාත් සමගම, සඳ අරණේ කඳුකර සද්දන්තයා, ගසේ

Copyrighted Material



කඳට හිස තබා වැරෙන් තල්ලුවක් දුන්නේය. ගස දෙදරුම් කා සෙලවී ගියේය.

ඊළඟට අඩි කිහිපයක් පස්සට ගිය ඌ, පොරට වැටුණ කුළු මීමෙකු මෙන්, හොඬය ඔසවා වනය හෙල්ලුම් කා යන කුංචනාදයක් නගමින්, තම ටොන් හය හතක් බර සිරුරේ මුළු වැර යොදා පොළොවෙන් අඩි දොළහක් පමණ උසින් ගසේ කඳට සුවිසල් හිස තියා යළිත් වරක් තල්ලුකර හැරියේය. 'ක්‍ර... ක්‍රාස්... ක්‍රෑෂ්...' හඬකුත් සමඟ ගස වෙවුලුම් කා ගියේ පරණලා පතක් මෙනි. ගසේ මුඳුන් අතුවල සිටි රිළා, වඳුරු, දඬුලේන් සත්තු රැන් පිටින් වෙනත් ගස්වලට පැනගත්හ. කලබලේට පැනගන්නට ගොස් වඳුරෙක් දෙන්නෙක් බිමටද වැටුණේය. උන්ගෙන් එකෙක් ඔළුව මතට වැදුණ පොලු පහරකින් අඩපණ වී හෝ මුළු පණම නැති වී ගොස් ගෝත්‍රිකයෙකුගේ කරේ රැඳුණේය.

ඇතා තම වෑයම අත්හළේ නැත. තෙවැනි, සිව්වැනි වතාවටත් ගසට පහර එල්ල විණි. එහෙත් ගස දෙදරුම් කමින් සෙලවෙනු විනා, පෙරළෙන්නේ නැති ලෙසකි. දූවැන්තයා මොහොතක් කල්පනා කළේය. ඉන්පසු ඌ පොළොවට දළින් ඇන ගසේ මුල් එකින් එක ගලවා දමන්නට වූයේය. මේ සියල්ලක් සිදුවෙමින් තිබෙන අතරතුරේ, හල් නිහඬව බලා නොසිටියේය.

"ටොටෝ, දම්වැල ගනින්." ඔහු ගස උඩ සිටම කෑගැවේය.

මේ මොහොතේ කළ යුත්තේ කුමක්දැයි ඔවුහු දැන සිටියහ. කුළු මීමුන්, රයිනෝසරයන් මෙන් අලි ඇල්ලීමට හිසට මඳු ගසන ක්‍රමයක් නැත. පසු පාදය ඔසවන අවස්ථාවක් බලා, මන්දක් හෝ තොණ්ඩුවක් දැමිය යුතු වේ. සටන පවතින ඉසව්වේ වැවී තිබුණ පෙඳ හා පාසි, බිම් වනස්ස ආදිය ගල් තළන මෝලකට අසු වූ විටක මෙන් පොළොවටම සමතලා වී ගොස් තිබේ. මුළු අවධානයම කරමින් සිටින වැඩය කෙරෙහි යොදමින් සිටි සද්දන්තයාගේ පිටුපසින්, ටොටෝ හා ඔහුගේ පිරිස් උගේ පස්සා කකුලට දම්වැල් තොණ්ඩුව රිංගවාගැනීමේ අවස්ථාව ලැබෙනතුරු කුරුමානම් අල්ලමින් පසු වූහ. මුල් කිහිපයක්ද ගලවා දැමීමෙන් පසු, බුල්ඩෝසරයෙන් එල්ලවන ප්‍රහාරයන් දරාගත නොහෙන වනස්පතිය තවදුරටත් හිස කඳ කෙළින් කරගෙන සිටීමට නොහැකි තරම් අසීරු තත්ත්වයකට පත්වී සිටියේය. ගස මුඳුනේ සිටි අන් සියලු සතුන් දැන් වෙනත් වෙනත් ගස්වලට පැනගෙන හමාරය. හල්, රොජර්, ජොරෝ තිදෙනාද පුළුවන්කමක් තිබුණි නම් ඒ ක්‍රමයම අනුගමනය කරනවා ඇත. ඔවුන්ට කළ හැකිව තිබූ එකම දෙය වූයේ, ගස තදින් බදාගෙන පසුවීම පමණි.

දම්වැලේ එක් කෙළවරක් ගල්කුළක පටලවා, අනෙක් කෙළවරින් මලපුඩුවක් සාදා ඇතාගේ පස්සා කකුල සමීපයෙන් තැබූ ටොටෝ වහා ඉවත් විය. ඇතා ඉදිරියට පස්සට ගමන් කරමින්, ගහට අනිමින් පෙරළා

www.musesbooks.com

Copyrighted Material



දැමීමට වලිකමින් සිටියි. දැන් කොයි මොහොතක හෝ ඌ මලපුඩුව මතට පා තබනු නොඅනුමානය. ටොටෝගේ පිරිස ඇතා ළඟට කිට්ටු කළේ උගේ අවධානය වෙන'තක යොමු කරවාලීමේ උත්සාහයක නිරත වෙමිනි.

ගස මත සිට සියල්ලක් බලා සිටින හල්, පිරිස ඇතා ළඟට කිට්ටු වනවා වැඩි බව තේරුම් ගත්තේය. යම් හෙයකින් ඌ ආපසු හැරී හොඬ වැනුවොත් පිරිසේ එකෙකු දෙන්නෙකුගේ අවසානය එය විය හැකි බව ඔහු දන්නේය.

"ජොරෝ, උඹ කොයි එකටත් තුවක්කුව මානාගෙන සූදානම් පිට හිටපන්. හැබැයි ඔන්න මං කියනකම් වෙඩි තියන්නේ එහෙම නෑ." හල් උපදෙස් දුන්නේය.

ජොරෝ කානු දෙකේ .500 තුවක්කුව, අවශ්‍ය වුවහොත් ඇසිල්ලකින් ක්‍රියාත්මක කළ හැකි සේ අටවාගෙන බලා සිටියේය.

"කෝ, ඕක මට දෙන්න." රොජර් තුවක්කුව තමා අතට ඉල්ලුවේය.

ජොරෝ, හල් දෙස බැලුවේය. හල් එක් ඇසකින් ඉඟියක් කර දෙපසට හිස වැනීය. බරපතළ මේ තුවක්කුව අවුරුදු දහතුනක ළමයෙකුට පහසුවෙන් ආම්බාන් කළ හැකි මෙවලමක් නොවේ. හල්, ජොරෝ දෙදෙනාගේ ඉඟි බිඟි, ක්‍රියා ප්‍රතික්‍රියා දුටු රොජර්ට කරුණු තේරුම් ගැනීමට අසීරුවක් නොවීය. ඇත්ත වශයෙන්ම අලියෙකු මරාදැමීමට ඔහුට ඇති විශේෂ ආශාවක් නැත. එහෙත් මූට වෙඩි තැබීමට අවශ්‍ය වුවහොත් එය තමා කළ යුතුයැ'යි ඔහුට නිකමට සිතුවිල්ලක් ඇති විය.

"අනේ අනේ හල්... උඹේ හිතේ මං ඔය තුවක්කුව කලින් පාවිච්චි කරලා නෑ කියලද? උඹට මං ඔට්ටුවක් අල්ලලා, යාර දෙසීයක් ඈතින් තියෙන සාඩින් ටින් එකකට ටක්කෙට වෙඩි තියලා පෙන්නනන්ටද? එහෙව් එකේ මහ විශාල ගෙයක් තරම් ලොකු ඔය සද්දන්තයාට ඉලක්කේ ගන්ට උඹේ හිතේ මට බැරිවෙයි කියලද?" රොජර් කීවේය.

හල් ජොරෝට කළ ඉඟියෙන් කානු දෙකේ .500 තුවක්කුව රොජර් අතට හුවමාරු විය. සැහෙන බරකින් යුතු තුවක්කුව වැනෙන ගසක් මතුපිට සිට වාකුල් කරගැනීම එතරම් පහසු කාර්යයක් නොවීය.

හල් අනුමාන කළ දේ සිදුවීමට යන ලෙසකි. තමාගේ පසුපසින් සිට මීමැස්සන් රංචුවක් මෙන් කන් කරච්චල් කරන ටොටෝගේ පිරිස සද්දන්තයා නොරිස්සුවේය. ඌ පස්ස හැරී පිරිස දෙස කෝපාවිෂ්ට බැල්මක් හෙළුවේය. ඉන්පසු උන් හඬා ලුහුබඳින්නට විය. පිරිස හිස් ලූ ලූ අත දිවගියහ. චණ්ඩ මාරුතයකට හසු වූ පරණලා පත් මෙන් විසිර ගත්හ. ඒ සමඟම .500 ගිනිඅවියේ ගිගිරුම් හඬ වනය දෙවනත් කරමින් පැතිර ගියේය. බකල් ගැසූ සද්දන්තයා කන්දක් කඩා වැටෙන්නාක් මෙන් පැත්ත වැටුණේය.

MusesBooks®

Copyrighted Material



රොජර් ගසෙන් බිමට බසිමින් සිටියේය. මෙතෙක් වේලා මරබියෙන් ගැහෙමින්, දෙපා වෙවුලමින් ගසේ ලැග සිටි රොජර් බිම දෙපා තබන තෙක් ඉවසුම් නැතිව සිටියේය. ඉදිරිපස මුල් බුරුල් වී, හස්ති රාජයාගේ ප්‍රහාරයෙන්ද බැට කා නළකළයක් මෙන් සැලෙන ගසේ, වෙවුලන දෑතින් දෙපයින් නැඟී .500 ගිනිඅවියක් පත්තුවීමේදී ඇතිවන ගැස්මද දරාගත නොහී, දැස් නිලංකාර වූ ස්වභාවයක්ද සමඟ රොජර්ට නිනව් නිච්චියක් නැතිව ගියේය. නිරක්ෂයාශ්‍රිත වනයන්හි බහුලව පොළොව වසා වැවෙන අඟල් කිහිපයක් උස පෙඳ පාසි තට්ටුවක් නොතිබෙන්ට, අඩි විස්සක් තිහකටත් වැඩි උසකින් බිමට පතබෑවුණ රොජර්ගේ හිස් කබොල්ල සුනු විසුනු වී මොළය සීසීකඩ විසිවී යනු නොඅනුමානය.

හන්ට්වරුන් උත්පත්තියෙන්ම ලබා උපන් ජන්ම දායාදයක් වූ 'වාසනාව' මෙතැනදීද ඔහුගේ පිහිටට අත පා රොජර් බේරා ගත්තේය. 'සඳ මඬලේ කඳුවැටිය' නොහොත් 'සඳ අරණ' නමින් හැඳින්වෙන මේ කඳුවැටියට පමණක් සීමා වූ, ඇතැම් විට අඩි පහ හයද ඉක්මවා උසට වැඩෙන, සුමුදු මුදු විල්ලුද පලසක් බඳු පාසි තට්ටුව ඇතුළටම රොජර් කිඳාබැස්සේය. ස්ප්‍රිං මෙට්ටයක් මතට වැටි ලෙසක මෙන් ඔහු එකෙණෙහිම වාගේ යළිත් ඉහළට විසිවී, නැවත පහළට කිඳාබැස්සේය. මේ අයුරින් ක්‍රමයෙන් බාල වී යන වේගයෙන් තවත් දෙතුන් විටක් ඉහළ පහළ ගොස් නිසල වූ විට, පියවි සිහිය ලද හෝ විමතියෙන් නෙත් දල්වා වටපිටාව බැලුවේ සද්දන්තයා කොහිද කියාය.

වටපිට බැලූ රොජර්ට දැකගන්ට ලැබුණේ, දැවැන්තයා සුවිසල් කළුගල් කුළක් මෙන් පැත්ත වැටී සිටින අයුරුය. ගෝත්‍රික පිරිස් ටිකෙන් ටික ඌට කිට්ටු කරමින් සිටිති. හල් සහ ජොරෝ තවමත් ගසින් බිමට රූටමින් සිටිති. දණ පණ ගා නැඟිටගත් රොජර් තමාගේ දඩයම ළඟට කිට්ටු කර බැලුවේය. මැරුණු ගෝලියාත් දෙස ඩේවිඩ් බලා සිටින දර්ශනය, බලා සිටින්නාට සිහි ගන්වමින් රොජර් ඇතා දෙස බලා සිටියේය.

'ඇත්තෙන්ම මේ වැඩේ කළේ මමද?' ඔහු තමාගෙන්ම අසා ගත්තේය. ඇත්තෙන්ම මේ සද්දන්ත හස්ති රාජයා මරාදැමීම තමන් කළ මහ ලොකු හපන්කමකැ'යි ඔහුට උජාරුවක්, ආඩම්බරයක්, අභිමානයක් ඇති නොවුණේය. තුවක්කුව කොකා ගැස්සීම මහා ලොකු වීරක්‍රියාවක් නොවේ. මේ සතා පණපිටින් අල්ලා මෙල්ල කරගන්නට ලැබුණි නම්, ආඩම්බරයක්, අභිමානයක් ඇති කරගැනීමට පිළිවන්කමක් තිබුණි.

ඔහු දැවැන්තයා පරීක්ෂා කළේය. උගේ උරහිසේ ඇනී කැඩීගිය හෙල්ලක කොටසක් තිබුණි. එය මලකඩ කා තුවාලය පැසවන්නට හේතුවක් වී තිබේ. 'එහෙනම් ඒකයි මූ මේ තරම් දරුණු වෙන්ට හේතුව. මිනිස්සු පෙන්නන්ට බැරිවෙලා තියෙන්නෙත් ඒ නිසා වෙන්න ඇති. තුවාලය ඌට සැහෙන වේදනාවක් දීලා තියෙනවා.' රොජර් තේරුම් ගත්තේය.

www.musesbooks.com

Copyrighted Material



"මගේ වෙඩිල්ල මුගේ කොහාටද වැදිලා තියෙන්නේ?" රොජර් විමසිල්ලෙන් බලමින් කීවේය.

"මේන් මෙතෙන්ට." හල් උගේ නළලත පසාරු කර ගොස් තිබූ තැන පෙන්වමින් කීවේය.

හල් සහ ජොරෝ මේ අතර කළේ මහ පුදුම දෙයකි. ඔවුන් දෙදෙනා එකතු වී සතාගේ පසු පාදයට දම්වැල් තොණ්ඩුවක් දමා අගුලු ලෑවේය.

රොජර් පුදුමයෙන් බලා සිටියේය. මැරුණු අලියාට දම්වැල් තොණ්ඩු දමා මොන එහෙකට බැඳ දමනවාද'යි ඔහු කල්පනා කළේය. ඔහුගේ ව්‍යාකුල මුහුණේ සටහන් ඉරියව් තේරුම්ගත් හල්, මලයා දෙස බලා මඳ සිනාවක් පෑවේය.

"රොජර්, මූ තාම මැරිලා නැහැ."

"මොනවා හල්? මැරිලා නැහැ? මොළය පසාරු කරගෙන වෙඩි උණ්ඩෙකුත් රිංගන් ගිහින් මූ මැරිලා නෑ කියලද උඹ කියන්නේ?"

"ඔව් මගේ පුංචි සහෝදරයා... වෙඩි උණ්ඩෙ උගේ මොළේ පසාරු කරගෙන ගියේ නෑ. මුගේ හිසේ ඉහළ කොටස එහෙම්පිටින්ම විශාල කටුවක්. ඒ ඔළුකටුව කොතෙක් හිල් වුණත් ඌට ජීවිත හානියක් නෑ. මොළේ තියෙන්නේ බොහොම යටින්. ඇස් දෙක අතර මැදින්. දැන් මෙයා ඉන්නේ සිහි නැතුවයි. තව මිනිත්තු කිහිපයකින් නැගිටලා අපූරුවට එහා මෙහා යාවි."

මෙවන් සද්දන්තයෙක් එකම එක වෙඩි පහරකින් තමාට මරාදැමිය හැකි විණැ'යි යම් ප්‍රමාණයක අභිමානයක් රොජර්ගේ සිතේ නොතිබුණාමත් නොවේ. ඔහුගේ මුහුණ හැකිළී, පුංචි වී යන ලෙසක් ඔහුට හැඟී ගියේය.

"ඔන්න එහෙනම් පුංචි දඩයක්කාර මහත්තයෝ, ඔයා ඔළුවට ඉලක්කයක් අරන් වෙඩි තියලා මරාදාපු සතාව තව ඩිංගකින් අපි පණ උපද්දෝලා නැඟිට්ටෝනවා." හල් කීවේ සිනාසෙමිනි.

රොජර් කල්පනා කළේය. ඔහුට තම සොහොයුරාගේ කීම තවමත් විශ්වාස නැත. .500 තුවක්කුවකින් හිසට වෙඩි පහරක් වැදුණු සතෙක්, ඇස් පනාපිට මැරී වැටී සිටියදී, තව මොහොතකින් නැඟී සිටිනවා ඇතැ'යි ඔහුට නම් ඇදහිය නොහැකිය. 'හල් මට වැඩිය අවුරුදු පහ හයක් වැඩිමල් වුණා කියලා එයාගේ හිතේ, ඔක්කොම දන්නේ එයා විතරක් කියල'යි රොජර් සිතීය.

හල් කියා ඇත්තේ සත්‍යයක් බව, ඔහුට වටහාගැනීමට වැඩි වේලාවක් ගත කිරීමට වුවමනා වූයේ නැත. කළු ජාතිකයින්ගේ අතර මුනුමුනුවක්, කසු කුසුවක් පැතිර යද්දී පැත්ත වැටී සිටි දැවැන්තයා ගොරොද්ද ඇද දෑස් විවර කළේය. ඒ වන විට හල් උගේ උරහිසේ තුවාලයෙන් මලකඩ කෑ හෙලි කැබැල්ල ඉවත් කර දමා, ප්‍රථමාධාර පෙට්ටියෙන් කිසියම් බෙහෙත් ද්‍රව්‍යයක් දමා අවසන් වූවා පමණකි.

www.musesbooks.com

Copyrighted Material



සියල්ලෝම ඌට ඉඩදී එහා මෙහා වූහ. ඌ වටපිටාව බැලුවේ නිදිමත දෑසකිනි. ඊළඟට හොඬය ඔසවා මහ හඬින් කුංචනාද කොට ළඟින්ම සිටි මිනිසා හඹා එන්නට විය. එහෙත් ඌට වැඩි දුරක් යන්නට නොලැබුණේ, පය බැඳි දම්වැල නිසාවෙනි. කකුලක් බැඳ ඇති බව දැනගත් සද්දන්තයා කෝපයෙන් වියරු වැටුණේය. ඌ දෙතුන් විටක් ඉහළටත් පහළටත් ගියේය. තෙවැනිවර පය ගසාදැමීමේදී අඟල් පහ හයක ප්‍රමාණයක් කකුලේ රැඳී තිබියදී, දම්වැල කැඩී ගියේය. බිම දිගේ ඇදී යන්නට තරම් ප්‍රමාණයක් නොවුණත්, පය වටා දම්වැල් තොණ්ඩුව පිටින්ම සද්දන්තයා කැලයට වැදී නොපෙනී ගියේය.

මඟ දිගට විටින් විට ඌ කෑගසමින් දිවූ හඬ අනුක්‍රමයෙන් නැසී ගියේය.

කැලයට වැදුණු දවැන්තයාගේ හඬ මැකී යත්ම සඳේ කඳු වළල්ලේ - සඳ අරණේ - සුපුරුදු නිහඬතාව රජයන්නට පටන් ගත්තේය. අහස සිඹින තරම් උස ගිරි ශිඛරයන්ගෙන් ගහන මේ කඳුකරය හැඳින්වුණේ සඳේ පිහිටි කඳු යායක් හැටියටය. පළාත් වැසි ගෝත්‍රික පිරිස් මෙපෙදෙස භාස්කම් ඇති අඩවියක් සේ සලකති.

අලි ඇතුන් අල්ලන්නට ගොස්, හිස් අතින් එන්නට සිදුවීම හල්, රොජර් දෙදෙනාම දුර්මුඛ කරලීමට සමත් විය. එහෙත් මේ මොහොතේ දඟකාර රොජර්ගේ මුහුණේ නම් වූයේ එක්තරා විදියක නරුම සිතිවිල්ලක් පාදක කොට උපන් සමච්චල් සහගත සියුම් සිනාවකි.

MusesBooks®

www.musesbooks.com